8th International Conference of Multidisciplinary Approaches (iCMA), 2021
Faculty of Graduate Studies,
University of Sri Jayewardenepura,
Sri Lanka.
ISSN: 2386 – 1509
Copyright © iCMA


# රොඩී විත්තියෙන් ප්‍රකට වන කවිනළු රංගක්‍රම පිළිබඳ අධ්‍යයනයක්

චන්ද්‍රසේකර සී.ඇම්.ආර්.පී.

ලලිත කලා අධ්‍යයනාංශය, මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
ramithpreshal04@gmail.com

**සාරසංක්ෂේපය**
අතීතයේ නාට්‍ය හැඳින්වීම උදෙසා නාඩගම්, කවිනළු, කවිරඟ හා නාට්‍ය යන පර්යාය පද රාශියක් යෙදී ඇත. කවිනළු යන්නෙන් කාව්‍ය නාටක යන්න අර්ථවත් වේ. යම් කතා පුවතක් පද්‍යාවලියකට අනුව රඟ දැක්වීම මෙම කවිනළුවේ දී සිදු වේ. සිංහල ජන සමාජයේ අතීතයේ පටන් අන-වින, කොඩිවින යන ගුප්ත විද්‍යා ශාස්ත්‍ර පිළිබඳ දැඩි විශ්වාස පවතිනු දක්නට ඇත. යම් පුද්ගලයෙකු හට අනිටු විපාක ඇති කිරීමේ අරමුණින් සිදු කෙරෙන ගුප්ත විද්‍යා කර්ම කොඩිවින ලෙස හැඳින් වේ. මෙම කොඩිවින බන්ධන ඉවත් කිරීමට නම් රොඩී ජනයා සතු නීචකුල මන්ත්‍ර භාවිත කළ යුතු බව මන්ත්‍ර ශාස්ත්‍ර සිදු කරන ඇදුරන්ගේ මතය යි. මෙම කොඩිවින බන්ධන ඉවත් කිරීමට ප්‍රථම රොඩී විත්තිය නමින් පද්‍යාවලියක් ගායනා කෙරේ. එම පද්‍යාවලියෙන් කියැවෙනුයේ අතීතයේ රොඩී කුලය ඇති වූ ආකාරය යි. මෙම රොඩී විත්තිය පද්‍යාවලියෙන් කවිනළු රංග ක්‍රම ප්‍රකට වේ ද? යන්න මෙම පර්යේෂණයේ ගැටලුව වේ. මෙම පද්‍යාවලිය ගායනා කරමින් ඉදිරිපත් කෙරෙන රංගයන්හි කවිනළු රංග ආකෘතික ලක්ෂණ අන්තර්ගත ව පවතී ද? යන්න හඳුනාගැනීම මෙම පර්යේෂණයේ අරමුණ යි. මෙය දේශීය සංස්කෘතික ලක්ෂණ ප්‍රකට කෙරෙන මානවවංශ විධි විවරණයක් වන හෙයින් දත්ත විශලේෂණය ගුණාත්මක පර්යේෂණ විධික්‍රමය යටතේ සිදු කරන ලද අතර උද්ගාමී තර්කන ඔස්සේ නිගමනයන්ට එළඹිණි. මෙම පර්යේෂණය සඳහා දත්ත රැස් කිරීමේ දී ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය භාවිත කරන ලදි. එහි දී ගාල්ලේ මනෝජ් ඒකනායක මහතා සතු රොඩී මාලය පද්‍යාවලිය ද අධ්‍යයනය කළ අතර පාරම්පරික ව නීචකුල බන්ධන කැපීම් සිදු කරනු ලබන පුද්ගලයින් සමග කරන ලද සම්මුඛ සාකච්ඡා මගින් හා ශාන්තිකර්ම නිරීක්ෂණ මගින් ද දත්ත රැස් කරගන්නා ලදි. ද්විතීයික සාහිත්‍ය මූලාශ්‍රය යටතේ පොත්පත්, සඟරා ආදියෙන් ද දත්ත රැස් කළේ ය. මෙසේ රැස්කර ගන්නා ලද දත්ත, විශ්ලේෂණයේ දී කවිනළු රංග සම්ප්‍රදායේ ඇතුළත් රංග ආකෘතික ලක්ෂණ වන ඉෂ්ට දේවතා නමස්කාරය, පොතේගුරු, අත්වැල් ගායන, ගායන වෘන්ද, වාදන වෘන්දය, රංග භූමිය ඉදි කිරීම, වාචික අභිනය, ආහාර්ය අභිනය, සාත්වික අභිනය යන රංග ආකෘතික ලක්ෂණ මෙම රොඩී විත්තිය නම් රංගනය රඟ දැක්වීමේ දී ඉදිරිපත් වන බව දක්නට ලැබුණි. එම කරුණු අනුව මෙම රොඩී විත්තිය යනු කවිනළු රංග ක්‍රමයක් බව මෙහි දී නිගමනය කළ හැකි විය.

**ප්‍රමුඛ පදඃ** *රොඩී, කවිනළුව, ජනයා, ආකෘතිය, අභිනය*